**පූජාපිටිය ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජීතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැ

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව
--------------------------------------------------
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
--------------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අදාළ මුලු ස්ථාවර තැන්පතු පොළි ආදායම රු.365,195 අඩුවෙන් හා ලැබිය යුතු පොළී ආදායම රු.2,809,386 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව | ස්ථාවර තැන්පතු පොළී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.3,334,733 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව | ස්ථාවර තැන්පතු ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් වැවල කොස්ගොල්ලේ ගෙදරගාව කුඹුර යන ඉඩමේ අගයඅවස්ථා 02 කදී එකතුව රු.1,584,832 ක් ලෙසටරු.1,338,512 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයෙහි අදාළ පිටුවල නිවැරදිව ඇතුළත් කරන බව | ඉඩම්වල නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා
--------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛනවල ශේෂ අතර රු.566,085 ක වෙනසක් පැවතුණි. | 2022 අවසන් ගිණුම මඟින් නිවැරදි කරන බව | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි අගය ගිණුම්වල ගැලපිය යුතුය |

1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.22,139,186 ක වත්කම් විෂයයන් 05 ක් තොග ලේඛන, සමීක්ෂණ වාර්තා හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිවැරදි උපලේඛන සකස් කර සභා අනුමැතියත් මත මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරන බව | ගිණුම් ශේෂ සඳහා වූ නිවැරදි සාක්ෂි පවත්වා ගෙන යා යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,337,527 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,490,730 ක්විය.

2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ආ) වරිපනම් | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ආදායම රු.3,682,088 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි පාරිභෝගිකයින් 92 දෙනෙකුගෙන් අය විය යුතු රු.911,623 ක් ද, ඒකකයක හිඟය රු.1,000 ට වැඩි බදුකරුගේ නම සඳහන් නොවූ වරිපනම් බදු පාරිභෝගිකයින් 195 දෙනෙකුගෙන් අය විය යුතු රු.520,086 ක් හා රජයේ ආයතන 05 කින් අය විය යුතු රු.126,178 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි. | සමස්ත හිඟ වරිපනම් අඩු කර ගැනීමට කටයුතු සිදු කර ඇති බැවින්, හිඟය අඩු වී ඇති අතර, රාජ්‍ය ආයතනවල හිඟ අය කර ගැනීමට අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති බව | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය |
| (ඇ) කඩ කුලී | | |
| සභාවට අයත් අඹතැන්න වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවලින් 2015 මාර්තු මාසයේ දී ප්‍රතිශෝධනය කර තිබුණු කඩ කුළිය අය නොකිරීම නිසා, 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාම සභාවට රු.2,100,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව | නව තක්සේරු මත කඩ කුලී අය කළ යුතුය. |

(ඈ) වෙනත් ආදායම්

------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

----------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, වසර අවසානයට අය විය යුතු රු.381,200 ක ගාස්තු ද අය කර නොතිබුණි. | 2022 වර්ෂයේ දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර අය කර ගැනීමට කටයුතු කරන බව | දැන්වීම් පුවරු ගාස්තු අය කළ යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී, සභා අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා මිලදී ගැනීමට අපේක්ෂා කළ ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු ලබාදුන් රු.225,000 ක තක්සේරුව නොසළකා පුද්ගලික තක්සේරුවක් මත රු.3,000,000 ක් ගෙවා ඉඩමක් මිලදී ගෙන තිබුණු බැවින්, රජයේ තක්සේරුව ඉක්මවා රු.2,775,000 ක් ගෙවා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව ලබා දුන් රු.225,000 තක්සේරුවට ඉඩම් හිමියන් එකඟ නොවූ බැවින්, පෞද්ගලික තක්සේරුකරුවන්ගෙන් තක්සේරු ලබා ගත් අතර, ඒ අනුව, රු.3,000,000 කට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව ඉඩම මිලදී ගත් බව | මිලදී ගැනීම් නිවැරදි අනුමැතිය හා අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ වූ පසු නිවැරදිව සිදු කළ යුතුය |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීම | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154 වගන්තිය ප්‍රකාරව, 2002 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි 03 ක් කොටස් කර විකිණීමේ දී, අය කළ යුතු සියයට 01 ක බදු මුදල අය කර නොතිබුණු අතර, පොදු කටයුතු සඳහා ලබා ගත යුතු ඉඩම් ප්‍රමාණය ද, ලබා ගෙන නොතිබුණි. | සිහි කැඳවීම් ලිපි, තොරතුරු විමසන ලිපි යොමු කර ඇති බව | ප්‍රාදේශීය සභා පනත අනුව ඉඩම් කොටස් ලබා ගැනීම හා බදු මුදල් අය කිරීම කළ යුතුය |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපහරණය කිරීම සඳහා භාවිතයෙන් ඉවත් කර තිබුණු සභාවට අයත් රු.10,622,462 ක ට්‍රැක්ටරයක් හා ගල් රෝලක් අපහරණය නොකර 2015 වර්ෂයේ සිට ද, අලුත්වැඩියාව සඳහා භාවිතයෙන් ඉවත් කර තිබුණු රු.3,297,282 ක කැබ් රථයක් හා යතුරු පැදියක් අලුත්වැඩියා නොකර 2019 වර්ෂයේ සිට ද නිෂ්කාර්යයව පැවතුණි. | නිෂ්කාර්යය වාහන සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දී ඇත. සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු සිදු කර ඇති බව | වාහන නිෂ්කාර්යයව නොතබා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කසළ කළමනාකරණය සඳහා යෝජිත එනසල්මඩ ඉඩම මැනීමේ හා පවරා ගැනීමේ ගාස්තු ලෙස රු.400,000 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට 2013 වර්ෂයේ ගෙවා තිබුණ ද, විගණිත දින වන විටත් එම ඉඩම පවරා ගෙන කසළ කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ ඉඩමේ පිඹුරුපත් හා ක්ෂේත්‍ර සටහන් ලබා ගැනීමට ලිඛිත ඉල්ලීම් කර ඇති බව | ඉඩම පවරා ගෙන අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය |